❖ 'හාස්‍යය හා උපහාසය දනවන අයුරින් කේවට්ට චරිතය නිරූපණයට ජාතක කතාකරුවා වෑයම් ගෙන ඇත' නිදසුන් සහිත ව විමසන්න.

කියවන්නාගේ මුවඟට සිනහව හෝ උපහාසය නංවන්නේ හාස්‍ය රසයෙනි. සිංහල ගද්‍ය - පද්‍ය සාහිත්‍යය තුළ කතාවක් රසවත් ව ඉදිරිපත් කිරීමේ තියුණු උපක්‍රමයක් වශයෙන් 'හාස්‍ය රස උත්පාදනය' භාවිතා වූ ආකාරය මෙරට ගද්‍ය - පද්‍ය සාහිත්‍ය කෘතීන් සියුම් ලෙස විමසන්නෙකුට හඳුනා ගැනීම එතරම් අපහසු නොවන්නේ ය. ඒ තරමට ම සිංහල ලේඛකයෝ එය යොදා ගත්හ. පන්සිය පනස් ජාතක කතා පොතේ එන උම්මග්ග ජාතකය ඇසුරෙන් උපුටා ගන්නා ලද සතර කන් මන්ත්‍රණය පාඩම විමසන විට ද ඒ බව පැහැදිලි වෙයි. මෙම කතාවේ එන කතා නායක මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතයට සතර කන් මන්ත්‍රණයෙන් පටන් ගැනෙනා කොටසෙහි ප්‍රමුඛ සතුරා බවට පත් වන කේවට්ට බමුණාගේ චරිතය හා ක්‍රියාකාරකම් දැඩි ව උපහාසයට නතු කරන උම්මග්ග ජාතක කතාකරුවා තියුණු හාස්‍යයක් උපදවමින් ඒ හරහා කේවට්ටවත්, ඔහු අයත් වන බ්‍රාහ්මණ වංශයත් අවඥාවට ලක් කෙරෙන්නේ කතාව කියවන්නාගේ කියැවීම් රුචියට ද රුකුලක් සපයමිනි.

හාස්‍ය රසය දෙපැත්ත කැපෙන තියුණු අවියකැයි කීම වැරදි නැත. එය නිවැරදි ව ගොඩ නොනැගුවොත්, එය කතා රසය මැරීමටත් - කතාව කතාකරුවාගේ පරමාර්ථයෙන් පරිබාහිරයට ඇදගෙන යන්නටත් සමත් වනු ඇත. කතුවරයා හාස්‍යය උපැදවීමට මුඛ්‍ය කර ගන්නා අවස්ථාව, සිද්ධිය, චරිතය හෝ වස්තුව කෙරෙහි සහෘදයාද අවඥා සහගත ව බැලීම මෙයට හේතුවයි. මේ හේතුව නිසා ම දක්ෂ නිර්මාණකරුවෝ හාස්‍ය උපැදවීමේ දී එහි සීමාවන් ගැන හොඳ අවධානයෙන් සිටිති. උම්මග්ග ජාතක කතාකරුවා ද තමන් හාස්‍යය උපැදවිය යුත්තේ කුමක් අරභයා ද යන්න පැහැදිලි ව හඳුනාගත්තෙකි. හේ කතා වස්තුව තුළ සියලු චරිත, සියලු සිද්ධි අරභයා හාස්‍යය මැවීමේ පරමාර්ථයෙන් ක්‍රියා නොකර තෝරා ගත් කේවට්ට චරිතය ප්‍රධාන කර ගෙන පමණක් ම හාස්‍යය උපදවනු දැකිය හැකි ය. බුද්ධකාලීන ව පවා බෞද්ධ ඉගැන්වීම්වලට ප්‍රබල අභියෝගයක් වූ බ්‍රාහ්මණ වාංශිකයන් කේවට්ටගේ චරිතය ඔස්සේ අවඥාවට ලක් කිරීම කතාකරුවාගේ මුඛ්‍ය පරමාර්ථය වී යැයි සිතෙනා තරමට ම මෙම කතා වස්තුව පුරා කේවට්ටගේ චරිතය හාස්‍යයට ලක් වන අවස්ථා බහුල ය. එවැනි අවස්ථා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කරනු වටී.

ජාතක කතාකරු යොදා ගන්නා කේවට්ට යන නාමය හේතුවෙන් පවා අදාළ චරිතයා සියුම් උපහාසයකට ලක් කෙරෙන්නේ වෙයි. ඒ නාමයේ අර්ථය 'ධීවරයා' යන්න ය. ඒ නාමය උපහාසයට ලක් වන්නේ අදාළ චරිතයේ ක්‍රියාකාරිත්වය සමඟ විමසන විට ය. මසුන් මරන්නෙකු සිය වාසිය අරභයා බිලි කොක්කක් අගට ඇම වශයෙන් පණුවෙකු අමුණන්නා සේ කේවට්ට ද සිය වාසිය අරභයා බ්‍රහ්මදත්ත රජු ඇම වශයෙන් යොදා ගනියි. කේවට්ටගේ උපායන් නමැති ඇම ගිලි බ්‍රහ්මදත්ත රජු ආදී අයවලුන්ට ගැළවීමක් නොවන බව පෙනෙද්දී මෙම 'කේවට්ට' යන නාමය අදාළ චරිතයාට මැනවින් ම ගැළපෙන්නක් සේ පෙනෙයි. සියුම් ලෙස විමසා බලන්නෙකුට ඒ නාමය පවා හාස්‍යයකට හේතු වෙයි.

සැකසුම - කසුන් වර්ණකුලසූරිය
පු/විද්‍යා චක්‍රවර්ති මහා විද්‍යාලය

සතර කන් මන්ත්‍රණය අවස්ථාවේ දී මන්ත්‍රණය අවසානයේ මඟුල් සල් ගස කොළත්තෙන් මතු වූ ගිරා පෝතකයා හැසිරෙන ආකාරයෙන් ද 'කේවට්ට' චරිතය දැඩි හාස්‍යයකට ලක් වනු දැකිය හැකි ය.

**"උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි දී සාල්ලෙක ලාලා පාතට බාන කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඬක් හෙළා, 'කිමෙක් දැ' යි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඬක් හෙළා....."**

සතර කන් මන්ත්‍රණය නමැති ක්‍රෑරතර උපාය බ්‍රහ්මදත්ත රජුට දැන්වීමට රජු සමඟ මඟුල් උයනට පැමිණෙන කේවට්ට පණ්ඩිතයාට මේ අත්විඳින්නට සිදුවන අත්දැකීම ඔහු කෙරෙහිත්, ඔහුගේ වංශය කෙරෙහිත් ජාතක කතාකරුවා තුළ පැවති දැඩි අප්‍රසාදය, පිළිකුළ පළ කෙරෙන අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. මේ තරම් කපටි, දරුණු උපායක් හිතූ කේවට්ටගේ හිසටත්, දන්වා බොහෝ දෙනෙකුට හානි කර සිය වාසිය උපදවා ගන්නට සිතමින් එය බ්‍රහ්මදත්ත රජුට හෙළි කළ මුඛයටත් ගිරා පෝතකයා ලවා වසුරු හොවන කතුවරයා සහෘද මනසෙහි ඒ සිදුවීම මවා කේවට්ට පණ්ඩිතයාට සිනා වෙන්නට සහෘදයාට අවකාශ උපදවයි. කතුවරයා කේවට්ටගේ චරිතය කෙරේ හාස්‍යය ජනනය කරවනා බව ඉන් මනාව පැහැදිලි කර ගත හැකි ය.

ඇතැම් අවස්ථාවක ඍජු ලෙස මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රකාශයන් ඔස්සේ ම කේවට්ට චරිතය හාස්‍යයට, උපහාසයට හා දැඩි අප්‍රසාදයට ලක් කරනට කතුවරයා වෑයම් ගන්නා බව දැකිය හැකි ය.

**"මේ කේවට්ට මහල්ලා ඇතුළු අඥාන ජඩයෝ මා තව ම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හ."**

සිය කතා නායකයා යොදා ගනිමින්, ඔහු ලවා ම විරුද්ධවාදියා අවඥාවට ලක් කරමින් කතුවරයා මේ පළ කරන්නේ කේවට්ට චරිතය කෙරෙහි ඇති සිය අප්‍රසාදයයි. කියවන අසන පාඨක ශ්‍රාවක ජනතාවට උපහාසාත්මක ව කේවට්ට දෙස බැලීමට බල කෙරෙන මෙවන් කියමන් හේතුවෙන් කේවට්ට චරිතය කෙරේ හාස්‍යයක් නූපදින්නේ යැයි කිසිවෙකුටත් කිව නො හැක.

එසේ ම මහෞෂධ පණ්ඩිතයන් කේවට්ටගේ සියලු උපායන් උපායශීලී ලෙස අසාර්ථක කරන කල්හි ද කේවට්ට අවඥාවට ලක් වෙයි.

**"ආචාරිනී, උපාය නම් තමා කිම් ද? මේ සා මහත් තොපගේ උපායෙකින් වැඩකුත්, නිමාවෙකුත් දුටු දැ නැති"**

කේවට්ට බමුණා මහෞෂධ පණ්ඩිතයන්ගේ නුවර වූ මියුලු නුවර අල්ලා ගැනීමට යොදන සියලු උපා මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා මහිමය ඉදිරියේ හිරු දුටු පිනි සේ වියැකී යන්නේ ය. මෙයින් දිගින් දිගට ම කේවට්ටයා හාස්‍යයට ලක් කෙරෙයි. මේ සා මහත් සේනාවක් ගෙනැවිත්, මේ තරම් රාජධානි



සැකසුම - කසුන් වර්ණකුලසූරිය
පු/විද්‍යා චක්‍රවර්ති මහා විද්‍යාලය

දිනාගත් කේවට්ටයාට මහෞෂධ ඉදිරියේ සාර්ථක වන්නට හැකි නො වෙයි. මෙසේ ජයග්‍රහණය පමා වීමෙන් ඔහු තමන්ගේ ම රජුගේ පවා අප්‍රසාදයට ලක් වූ ආකාරය ඉහත උද්ධෘතයෙන් හෙළි වෙයි. එයින් පවා මැවෙන්නේ මේ චරිතය කෙරෙහි සියුම් උපහාසයකි.

කේවට්ටගේ චරිතය කෙරෙහි උපරිම උපහාසය ඉස්මතු කෙරෙන අවස්ථාව වන්නේ 'ධර්ම යුද්ධය' අවස්ථාව ය. ධර්ම යුද්ධය සඳහා කේවට්ට බ්‍රහ්මණයා නො ඉවසිල්ලෙන් රැඳී සිටින ආකාරය පවා කතුවරයා මවා දක්වන්නේ සහෘද මනසෙහි ඔහු ගැන හාස්‍ය රසයක් මැවෙන්නට ඉඩ හසර සලසමිනි.

**"මහා බෝසතාණන් වඩනා පෙර මඟ කර ඔසව ඔසවා බලාගෙන සිටීමෙන් කොක් කරක් සේ දික් වූ කර ඇති වූහ."**

කේවට්ටගේ හැසිරීම කතුවරයා මවා දක්වන්නේ සහෘද මනසෙහි චිත්ත රූප මැවෙනා අන්දමිනි. මහෞෂධ පණ්ඩිතයන්ගේ සිතා මතා කෙරෙන ප්‍රමාදයෙන් නො ඉවසිලිමත් වෙමින් ඔහු හැසිරෙන ආකාරය සහෘද පාඨක ශ්‍රාවක සමූහයාගේ මුවඟට සිනහවක් නංවන්නට සමත් වෙයි. ඒ සිනහව නැගෙනුයේ කේවට්ට විසින් ගෙල ඔසව ඔසවා කරන නො ඉවසිලිමත් නිරීක්ෂණය උපහාසයට නගනු වස් කතුවරයා යොදා ගත් '**කොක් කරක් සේ දික් වූ කර ඇති වූහ**' යන ප්‍රකාශය හේතුවෙනි. සාමාන්‍ය ජන ව්‍යවහාරයෙන් උකහා ගත් ඒ ප්‍රකාශය අද පවා යෙදෙන්නේ කෙනෙකු උපහාසයට ලක් කරනු සඳහා ය. කතුවරයා ඉඩ ලැබෙන හැම විට ම මේ චරිතය උපහාසයට ලක් කරමින් හාස්‍ය රසයකට වෙර දරන බව මෙයින් ද පැහැදිලි වෙයි.

කේවට්ට චරිතය කෙරෙහි ප්‍රබල ම උපහාසය නැගෙන්නේ ඉන් අනතුරුව ය.

**"නැඟී සිටුව! ආචාරිනී, නැඟී සිටුව! මම බාලයෙමි. තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි මා නොවඳුව"**

සිරිත් විරිත් මැනවින් දන හැඳුනෙකු සිය ආචාර සම්පන්න භාවය හේතුවෙන් වැඩිහිටියෙකුට දක්වන ආචාරයක් වංචනික ලෙස සිය වාසියට හරවා ගන්නට තරම් උපායශීලියෙකු වූ කේවට්ට මහෞෂධ පණ්ඩිතයන්ගේ උපායෙන් ඔහු ඉදිරියේ බිමට නැඹුරු වෙයි. සිය උපාය පවා අමතක කොට මාණික්‍යයක් අරභයා ඇති කරගත් ලෝභයෙන් කේවට්ට බමුණා මහෞෂධ ඉදිරියේ පරාජයට පත් වූවා පමණක් නොව සියලු දෙනාගේ උපහාසයට ද ලක් වූයේ ය. ඒ උපහාසය මැවෙන්නේ කතුවරයා මෙම ජවනිකාව මවා දැක් වූ ආකාරයේ ඇති ප්‍රබල හාස්‍ය ජනක ස්වරූපය හේතුවෙනි. කේවට්ට චරිතය කෙරේ කතුවරයා හෙළන උපහාසයේ දෙනෙත ඉන් මැනවින් පැහැදිලි වෙයි.

උම්මග්ග ජාතක කතාකරුවා මේ ආකාරයෙන් සිය කතා වස්තුව විකාශනයේ දී සහෘදයා ඊට බැඳ තබන්නට සමත් උපායක් වශයෙන් ප්‍රබල හාස්‍යයක් මවමින් සහෘද පාඨක ශ්‍රාවක මුවඟට සිනාවක් ඉපැද වූ අතර ඒ ඔස්සේ කේවට්ට චරිතය කෙරේ සිය අප්‍රසාදය මවමින් ඔහු අවඥාවට ලක් කෙරෙන උපහාසයක් මවන්නට ද සමත් වී තිබෙයි.

සැකසුම - කසුන් වර්ණකුලසූරිය

පු/විද්‍යා චක්‍රවර්ති මහා විද්‍යාලය